# සිරිමාවෝ ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනිය
## කාන්තාවන් වෙනුවෙන් ඉටුකළ මෙහෙව

මානෙල් අබේසේකර

කාන්තා අයිතීන් ලබාගැනීමට බණ්ඩාරනායක මැතිනිය දියත් කළ අරගලයේ වැදගත් බලපෑම, එක් අතකින් ස්ත්‍රීත්වය, මාතෘභාවය සහ බලගැන්වීමේ සම්මිශ්‍රනයක් වූ ඇයගේ පෞරුෂයෙන් ප්‍රකට වූ අතර අනෙක් අතට ඇයගේ වචනයෙන් සහ ක්‍රියාවෙන් ව්‍යක්ත ලෙස ප්‍රකාශ විය.

එතුමිය ලංකාවේ අගමැති වී - ලොව ප්‍රථම කාන්තා රාජ්‍ය නායිකාව වූ විට ඈ එකෙනෙහිම ස්ත්‍රීන් බලවත් කිරීමෙහිලා ප්‍රතිමූර්තියක් වූවාය. ඒ එක්සත් ජාතීන්ගේ සංවිධානය කාන්තාවන් සඳහා වන (1975 වසරේ දී මෙක්සිකෝවේ පවත්වන ලද) ප්‍රථම ලෝක සම්මේලනයේ ප්‍රධාන කථිකයා ලෙස දේශනය පැවැත්වීමට ඇයට ආරාධනා කිරීමට දශක එකහමාරකට ප්‍රථමයෙන්ය. ඇය කිසිම පැකිලීමකින් තොරව පහසුවෙන් එම කාර්යය ඉටු කළේ එයටම උපන් කෙනෙකු ලෙසය. තම ජනතාවට මෙන්ම සෙසු ලෝකයාට ද එතුමියගේ භූමිකාව පිළිගැනීමට සිදුවිය.

ලංකා අගමැති වීමට පෙර ඇය මහජනයා ඉදිරියේ පෙනී සිටියේ මුලින් ඇමති කෙනෙක්ව සිට පසුව ලංකා අගමැති වූ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ භාර්යාව වශයෙන් හුදු උපාංගයක් ලෙසිණි.

කෙසේ වුව ද තරමක අප්‍රකට තත්‍වයක් පැවති මේ කාලයේ දී පවා ඇය තම කැමැත්තෙන්ම, තම සිතැඟි පරිදි පුළුල් ජන කොටසක් සමග ගැවසෙමින් ක්‍රියාකිරීම ආරම්භ කර තිබුණි. ඇයගේ විශේෂ උනන්දුව වූයේ ස්ත්‍රීන් බලගතු කිරීමය. මහිලා සමිති ව්‍යාපාරය මගින් ඇයට අවශ්‍ය වූයේ කුසලතා දියුණු කිරීම සහ ග්‍රාමීය ස්ත්‍රීන්ගේ ආදායම් උපයා ගැනීමේ විභවතා පුළුල් කිරීමයි.

තම ස්වාමි පුරුෂයා වූ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ ජීවිතය සාහසිකයෙකු අතින් හදිසියේ අතිශය සංවේගී ලෙස අවසන් වූ අවස්ථාවේ දී ඇය ක්‍රියා කළ ආකාරයෙන් ඇයගේ ප්‍රකෘත්ති ස්වභාවය හා ධෛර්යය, මොනවට ප්‍රකාශ විය. තම පෞද්ගලික සංවේගය නොතකා එතුමිය එම අවස්ථාවට උචිත පරිදි ඉදිරිපත් වී තම පවුලට මෙන්ම රටට ඉටුවිය යුතුව තිබුණ වගකීම් ගැහැණියකුට පමණක් විශේෂ වූ තුලනාත්මකව සහ එඩිතරව ඉටු කළාය. බලයේ ප්‍රභවයට නුදුරින් ගත කළ කාලය තුළ දී එතුමියට තමා ගැන මනා අවබෝධයකුත් තම ශක්තීන් ගැන ආත්ම විශ්වාසයකුත් ඇති කර ගැනීමට හැකි විය. තමන්ගේ සිතුවිලි අනුව කටයුතු කිරීමටත්, දැඩි විශ්වාසයකින් ක්‍රියාකර තම ගැහැණුකම රැකගෙන සමාජයේ යහපත සඳහා දායක වීමටත් හැකි විය. මේ අනුව රාජ්‍ය නායිකාව ලෙස තම තත්ත්වය රැකගෙන එම භූමිකාවට ස්ත්‍රීත්වයත්, මාතෘත්වයත් මුසුකර ක්‍රියාකිරීමේ හැකියාව එතුමියට තිබුණි. මෙම පූර්ණ සහ ප්‍රායෝගික ප්‍රවේශය මගින් ඇයට සියළු තරාතිරමේ ගැහැණුන්ගේ සිත් ගැනීමට හැකි විය.

යම් ප්‍රශ්නයක සියළු පැතිකඩ ගැන මනා වැටහීමක් ලබාගෙන ක්ෂණික තීරණ ගෙන ක්‍රියාත්මක වීමට ඇයගේ තියුණු බුද්ධිය ඇයට උපකාරී විය. වේගයෙන් මෙන්ම කාර්යක්ෂමව සිතා කටයුතු කිරීමේ මෙම හැකියාව ගැහැණුන්ට අත්වන්නේ, කුසගින්නේ, අපිරිසිදුව හඩා වැළපෙන තම ළමා ලපටීන්ට කවා පොවා සතපා ඔවුනට සහාය සපයන ගෙදර දොරේ වටපිටාවෙන්ය. මෙවන් සන්දර්භයක පමා වී තමන්ට ආවේණික මන්දගාමිත්‍වයකින් ක්‍රියා කිරීමේ සුඛෝපභෝගී විවරණයක් ගැහැණුන්නට නොමැත. මේ අනුව පැරණි ආප්තෝපදේශය "කාලයත්, රළ පහරත් ගැහැනියකට අවශ්‍ය පරිදි නවතින්නේ නැත" යනුවෙන් වෙනස් කිරීමට මට සිතේ! වේගයෙන් සිතා අප්‍රමාදව ක්‍රියා කිරීමට බණ්ඩාරනායක මැතිනිය සතු ශක්තිය මා සිතන අන්දමට ඇයට ලැබී ඇත්තේ තම නිවසේ භාර්යාවක් ලෙසත්, මවක් ලෙසත් ඇය ලත් ආභාෂය හේතුවෙන්ය.

තම ස්ත්‍රීත්‍වය, රාජ්‍ය කටයුතු අංශයේ දී එතුමියට උපකාරී වූ තවත් අංශයක් නම් කාල කළමනාකරණයයි. අගමැති තනතුරට අමතරව එතුමිය අමාත්‍යාංශ තුනක් මෙහෙය වූවාය - ආරක්ෂක, විදේශ කටයුතු සහ ක්‍රමසම්පාදන එම අමාත්‍යාංශයි. එහි ප්‍රතිඵලය වූයේ මෙම සියළුම අමාත්‍යාංශයන්ගේ අවධානය යොමු විය යුතු සියළුම ප්‍රශ්න ගැන ක්‍රියා කිරීමට හැකිවනසේ කාලය උපරිම ආකාරයෙන් උපයෝගී කර ගැනීමට සිදුවීමය. තම නිවෙස්වල පැනනගින අසීමිත ප්‍රශ්නවලට මුහුණ දීමේ දී නිතැතින්ම කාලය කළමනාකරණය කිරීමට සෑම තරාතිරකම ස්ත්‍රීන්ට සිදුවේ. තම නිවාසවලින් බාහිරව වැඩ කරන ගැහැණුන්ට මෙම ප්‍රශ්නය තවත් සංකීර්ණ වේ. නිවසේ අවශ්‍යතා මෙන්ම තම වැඩ බිමේ අවශ්‍යතා ගැන ද සැලකිලිමත් වීම අවශ්‍ය වන හෙයිනි. 1976 වසරේ දී කොළඹ පැවති 5 වැනි නොබැඳි ජාතීන්ගේ සමුළුවේ දී ඇය සතු නොපැකිලව තීරණ ගැනීමේ හැකියාව සහ කටයුතු මෙහෙය වීමේ සහ පාලනය කිරීමේ කෞශල්‍යයන් මනාව ප්‍රදර්ශනය විය. ඒ ඒ පුද්ගලයින් තම වගකීම් ක්ෂේත්‍රයන්හී ක්‍රියා කරන ආකාරය නිරීක්ෂණය කර මෙහෙය වීම සඳහා එතුමිය අධ්‍යක්ෂ ජනරාල් වරයෙක් පත් කළාය. පසුව එක් එක් නිලධාරියා තමන්ට ඉදිරිපත් කල වාර්තා අනුව මුළු සංවිධාන කමිටුවේ කාර්යයන් මෙහෙය වීමට ඇයට හැකි විය. අවසාන ප්‍රතිඵලය වූයේ රාජ්‍ය නායකයින් 92 ගේ සහභාගිත්‍වය ඇතිව පැවැත් වූ 5 වැනි නොබැඳි සමුළුව ඉතාමත්ම සාර්ථක සමුළුවක් බවට පත්වීමයි.

බණ්ඩාරනායක මැතිනියගේ අචල විශ්වාසය වූයේ කාන්තා අයිතීන් තහවුරු කිරීම සාමය සහ සමගිය සඳහා පූර්ව අවශ්‍යතාවක් බවයි. ඇයගේ විශ්වාසය වූයේ සාමය සහ සමගිය ආවේණික බැඳීමකින් යුක්ත, බෙදා වෙන් කළ නොහැකි කරුණක් බව සහ එය ස්වාභාවික යුක්ති ධර්මය මත පදනම්ව ඇති බවය. ඇය කියා සිටියේ කාන්තාවන්ගේ පරිශ්‍රමය විය යුත්තේ සමාජයේ කිසියම් තැනක් ලබාගැනීම නොව සමාජයේ අවශ්‍ය ප්‍රබල කොටසක් විය යුතුය යන්නයි. මෙම සත්‍යය පිළිගැනීම

වෙනත් අංශයන් සම්බන්ධ දියුණුවට පසුව, අනුක්‍රමිකව ඉටුවිය යුත්තක් නොව සමානත්වයට කාන්තාවන්ගේ අයිතිය මිනිස් අයිතිවාසිකමක් බැවින් එය එකහෙළා ඉටුවිය යුතු බවයි. ඇයගේ විශ්වාසය වූයේ කාන්තාවන්ට සම අයිතියක් නොදී සිටීම මනුෂ්‍ය හිෂ්ඨාචාරයේ කැළලක් බවයි. ඇය ලොව පුරා ස්ත්‍රී වර්ගයා සමග එක් වී සටන් වැදුනේ එම විශ්වාසයෙහි පිහිටා, සමාන අයිතීන් සහ තම විභවයන්ගේ පූර්ණ මල්පල ගැන්වීම සඳහා වන නිදහස උදෙසාය.

කෙසේ වුව ද, එතුමිය කාන්තා අයිතීන් ලබාගැනීමට කෙතරම් ප්‍රබල සටනක යෙදුනත් බිම් මට්ටමේ යථාර්ථයන් නොසලකා හැරියේ නැත. සමාජ ආර්ථික විවිධත්වය හා ජාතික මෙන්ම අන්තර්ජාතික වශයෙන් පැවති අසාමාන්‍ය සංවර්ධනයෙන් සංකීර්ණත්වය ගැන එතුමියට මනා වැටහීමක් තිබුණ හෙයින්, සමානත්වය පිළිබඳ දෘඪ සංකල්පයක එල්බ නොගෙන හැඩ ගැසීම සහ එක්ව ක්‍රියා කිරීම ගැන විශ්වාසය තැබුවාය. එක් විසඳුමක් සැමට නොගැලපෙන බව ඇයට ප්‍රත්‍යක්ෂ වී තිබුණි. ලෝක බැංකුව පැවසූ පරිදි එක ප්‍රමාණයක පාවහන් සැමට ගැලපෙන්නේ නැත.

එතුමියගේ මතය, එක්සත් ජාතීන්ගේ පළමුවන කාන්තා සම්මේලනය අමතා ඇය කළ කථාව ආශ්‍රයෙන් ගෙනහැර දැක්වීමට මම කැමැත්තෙමිඃ

- සියලු පරිශ්‍රමයේ - සංවර්ධනයන් සහ අරගලයන්හී පරිසමාප්තිය සාමකාමී එකඟතාවයයි, සමගියයි. බෙදා වෙන් කළ නොහැකි මෙම තත්ත්වයන් සමාජයේ සහ පොදු ජීවිතයේ සෑම තලයක දීම පැහැදිලිව ප්‍රකාශ විය යුතුය, දක්නට තිබිය යුතුය. ජන සමාජයට, රටට සහ අවසානයේ දී මුළු මිනිස් පවුලටම, සාමය සහ සමගිය කිඳා බසිනුයේ නිවසේ සිටය.

- අපගේ මේ සියලු සාකච්ඡාවන්ගේ හර ඇදහීම, ගැහැණුන් සහ මිනිසුන් අතර සමානත්වය මත පදනම් වූ හවුල් සංවර්ධන වැඩපිළිවෙළකින් පමණක් දරිද්‍රතාව, විරැකියාව, ලෙඩ රෝග සහ නොදැනුවත් කම තුරන් කළ හැකිය යන්න මට කිසිසේත් අමතක වී නැත. මෙම මතයට මාගේ සම්පූර්ණ එකඟත්වය හිමි වේ. එසේ වුව ද, එක් එක් සමාජයේ දේශපාලන, සමාජ, සංස්කෘතික සහ ආර්ථික වෙනස්කම් නොතකන සමානත්වය පිළිබඳ දෘඪ නිර්වචනයක් මට පිළිගත නොහැක.
- සමානත්වය පිළිබඳ දෘඪ සංකල්පයට විකල්පයක් ලෙස ස්ත්‍රී පුරුෂ අනුපූරකත්වය ඉදිරිපත් කළ හැක.
- අප සොයමින් සිටින්නේ අනුවර්තනය බව අමතක නොකළ යුතුය - මන්ද යත් කල් පවතින ජීව ඒකකයක රජයන සිද්ධාන්තය අනුවර්තනයයි.
- දශක තුනක් පුරා මානව පවුල ගෙන ගිය එක්සත් පරිශ්‍රමයක අවසන් ප්‍රතිඵලය ලෙස මෙම සම්මන්ත්‍රණයෙන් කාන්තාවන්ට සමාජයේ මතුපිට තැනක් ලැබීම ගැන මම සෑහීමකට පත් නොවෙමි. කාන්තාවන් සමාජ සංයුතියේ වෙන්කළ නොහැකි කොටසක් බැවින් මතුපිට තැනක් අවශ්‍ය නොවේ.
- සමාජයේ තමන්ට හිමි භූමිකාව තෝරා ගැනීමේ අයිතිය කාන්තාවන් සතුය.
- ගැහැණුන්ගේ තත්ත්වය පිළිබඳ වෙනසක් ඇති කිරීමට යම් ප්‍රමාණයක ආර්ථික ස්ථාවරත්වයක් සහ ස්වශක්තියක් ඇතිවන තෙක් සිටිය යුතුය යන්න අපට පිළිගත නොහැකිය. ගැහැණුන්ගේ ප්‍රශ්න සමාජීය සහ ආර්ථික වශයෙන් වඩා වාසිදායක තත්ත්වයක් උදාවන තෙක් කල් දැමිය නොහැක. අප රටවල ආර්ථික සංවර්ධන ක්‍රියාදාමය කෙතරම් සංකීර්ණ ද යත්, එවැනි අනුපූරක ප්‍රවේශයක් ගැන විශ්වාසය තැබිය නොහැකිය.
- දැන් අප ඉදිරියේ දක්නට ලැබෙන්නේ මෙතෙක් ජාත්‍යන්තර ප්‍රජාව වෙන් වෙන්ව මුහුන් පමුණුවා ගැනීමට යන්න දැරූ කරුණු තුනක් අව්‍යාජව, ප්‍රායෝගිකව ගැලපීමට දරන

ප්‍රයත්නයකි - එනම් මූලික මිනිස් අයිතීන්, පළමුවන සහ දෙවන සංවර්ධන දශකයන්ගේ අපේක්ෂාවන් සහ නිරායුධ දශකයේ අපේක්ෂාවන්ය.

- මෙලෙස අදහස් හුවමාරු කර ගැනීම මෙන්ම, මෙම සම්මන්ත්‍රණයේ සහේතුක බව ද, ජාතීන්ගේ අත්දැකීම් බෙදා ගෙන ඒවා ආශ්‍රයෙන් විශ්ව අරමුණු හා සම්බන්ධ ඉහළම පොදු හරයක් සකසා ගැනීම විය යුතුය යන අදහස මා බොහෝ සේ ධෛර්යමත් කර තිබේ.
- ස්ත්‍රීන්ගේ ඒකායන අරමුණ නම් ජීවිතයේ සියලුම අංශ සම්බන්ධයෙන් පිරිමින් සමග නියම සමානත්වයක් ඇතිකර ගැනීමය. මෙම අරමුණ පදනම් වී ඇත්තේ ස්වභාවික යුක්ති ධර්මය මතයි. යම් තැනක එයට ඉඩ ඇහිරී ඇත්නම් එය සමස්ත මානව ශිෂ්ඨාචාරයටම කැළලකි.
- තම අයිතිවාසිකම්වලට සහ විභවයන්ට අවකාශ ලබාගැනීම සඳහා කාන්තාවන් ලොවපුරා ගෙන යන අරගලයට මා එක්වන්නේ මෙවන් සහයෝගීතාවයක් මත පිහිටාය.

මෙම සම්මන්ත්‍රණයට (මේ ලිපිය සපයන) මම ප්‍රධාන ප්‍රොටෝකෝල නිලධාරී ලෙස එතුමිය සමග ගියෙමි. ආපසු පැමිණි විගස, කාන්තාවන්ගේ තත්ත්වය නගා සිටුවීම සඳහා අප අනුගාමී කටයුතු වශයෙන් ගතයුතු ක්‍රියාමාර්ග ගැන මාගේ මත ඉදිරිපත් කරන ලෙස ඇය මට කීවාය. මෙයින් කාන්තා අයිතිවාසිකම් ගැන එතුමියගේ දැඩි උනන්දුව ප්‍රකාශ වනවාට අමතරව බොහෝ නායකයින් තුළ දක්නට නොලැබෙන ඇයගේ පෞරුෂයේ ලක්ෂණයක් ද පෙන්නුම් කරයි. මම, ආරම්භයක් වශයෙන් ව්‍යාපෘති තුනක් යෝජනා කළෙමි;

(1) කාන්තාවන්ට බොහෝ සෙයින් අවශ්‍ය වන යොමුගත ලක්ෂයක් පාලන තන්ත්‍රය තුළ ස්ථාපිත කිරීම.

(2) ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගැන ප්‍රකාශනයක් - මෙය වැදගත් වනුයේ කාන්තාවන්ගේ වැඩකටයුතු ගැන තොරතුරුවල ඌනතාවයක් තිබීම නිසාය.

(3) කාන්තාවන්ට සම අයිතිවාසිකම්වල අවශ්‍යතාව හුවා දක්වන චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම.

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශනය සම්පාදනය කරනු ලැබීය. නමුත් චිත්‍රපටය සඳහා වූ අන් පිටපතෙහි අඩුපාඩු තිබුණි. යොමුගත ලක්ෂය පිළිබඳ අදහස ඉදිරියට ගෙනයාමේ අදහසින් කාන්තා කාර්යාංශයක් පිහිටු වීමට කැබිනට් පත්‍රිකාවක් සකස් කළ නමුත්, කොළඹ පැවැත්වීමට නියමව තිබුණ පස්වැනි නොබැඳි සමුළුව ආශ්‍රිත වැඩ කටයුතු සඳහා බණ්ඩාරනායක මැතිනියට නිතර විදේශ ගත වීමට සිදු වූ හෙයින් එය ක්‍රියාත්මක කිරීමට නුපුළුවන් විය. එය පසුව, 1978 දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විසින් පිහිටුවන ලදී. මෙම අංශයෙහි ක්‍රමයෙන් ඇති වූ ප්‍රගතිය හේතුවෙන් කාන්තා අමාත්‍යාංශයක් බිහිවුන අතර, කාන්තා ප්‍රඥප්තියක් ද ප්‍රකාශයට පත්කරන ලදී. එය ක්‍රියාත්මක කිරීමට කාන්තාවන් පිළිබඳ කමිටුවක් ද ස්ථාපනය කෙරිණ. මේ සියල්ල බණ්ඩාරනායක මැතිනියගේ උනන්දුව, ආරම්භය සහ උත්සාහය නිසා දියත් වූනු බව අමතක නොකළ යුතුය.

එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණයේ දී කාන්තා අයිතීන් අරභයා බණ්ඩාරනායක මැතිනිය නැගූ හඬ ලොව පුරා පැතිර ගොස් වැඩි කලක් යාමට පෙර ආසියාව, මැද පෙරදිග යුරෝපය සහ ලතින් ඇමෙරිකාවේ කාන්තා රාජ්‍ය නායිකාවන් මතුවිය. කාන්තාවන්ට සම අයිතිය සියලු තන්හී සෑම තලයකම යථාර්ථයක් කිරීමට අවශ්‍ය අරගලය දේශපාලන කැපවීම සොයා දිගින් දිගටම ක්‍රියාත්මක වෙයි. මීට පෙර ඉතිහාසය "ඔහුගේ කථාව" මිස ඇයගේ කථාව නොවීය. නමුත් මෙම තත්ත්වය වෙනස් කිරීමට බණ්ඩාරනායක මැතිනියට හැකි විය.